# සිංහල - භාෂා ප්‍රවේශය

**ජ්‍යෙ. කථි. මොරකන්දේගොඩ අරියවංස හිමි** email - ariyawansamora@gmail.com

## හෝඩිය හෙවත් අක්ෂරමාලාව

සිංහල භාෂාවේ විකාසනය දෙස අවධානය යොමු කරන විට එහි අක්ෂරමාලා කිහිපයක් දැක ගත හැකි ය.

1. බ්‍රාහ්මී යුගයේ සිංහල අක්ෂරමාලාව
2. සිදත් සඟරා අක්ෂරමාලාව
3. ශුද්ධ සිංහල අක්ෂරමාලාව
4. මිශ්‍ර සිංහල අක්ෂරමාලාව
5. ජාතික අධ්‍යාපන ආයතන අක්ෂරමාලාව
6. සමකාලීන සිංහල අක්ෂරමාලාව
7. ජාත්‍යන්තර සිංහල අක්ෂරමාලාව

මේ එක එකක් පිළිබඳ කෙටි විමර්ශනයක් පහත දැක්වේ.

### 2. සිදත් සඟරා අක්ෂරමාලාව

අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ (10)

ක ග ජ, ට ඩ ණ, ත ද න, ප බ ම, ය ර ල ව, ස හ ළ (අ)ං (20)

- **සිදත් සඟරා අක්ෂරමාලාවේ විශේෂතා**

'ඇ ඈ ඍ ඎ ඏ ඐ ඓ ඖ' යන ස්වර, සඤ්ඤකාක්ෂර, මහාප්‍රාණ අක්ෂර, ඌෂ්මාක්ෂර වන 'ශ, ෂ', විසර්ගය, වර්ගාන්ත අක්ෂර වන 'ඞ, ඤ' හා 'ච' අක්ෂරය සිදත් සඟරා හෝඩියේ ඇතුළත් නො වේ. ('ච' වෙනුවට සෑම විට ම පාහේ 'ස' භාවිත වීම) උදා: චතු > සිවු, චන්ද > සඳ, චර්ම > සම

### 3. ශුද්ධ සිංහල අක්ෂරමාලාව (අමිශ්‍ර සිංහල / නුමුසු හෙළ)

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ (12)

ක ග ජ, ට ඩ ණ, ත ද න, ප බ ම, ය ර ල ව, ස හ ළ (අ)ං (20)

(මෙහි වෙනස 'ඇ, ඈ' එකතුවීම පමණි)

### 4. මිශ්‍ර සිංහල අක්ෂරමාලාව

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඒ ඓ ඔ ඕ ඖ (18)

ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ, ට ඨ ඩ ඪ ණ, ත ථ ද ධ න, ප ඵ බ භ ම, ය ර ල ව, ශ ෂ ස හ ළ (අ)ං (අ)ඃ (36)

- **මිශ්‍ර සිංහල අක්ෂරමාලාවේ විශේෂතා**

'ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ' යන ස්වර, ඛ, ඝ, ඡ, ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ යන මහාප්‍රාණ, ඌෂ්මාක්ෂර වන 'ශ, ෂ', විසර්ගය, 'ච' අක්ෂරය, වර්ගාන්ත අක්ෂර වන 'ඞ, ඤ' අන්තර්ගත වීම.

### 5. ජාතික අධ්‍යාපන ආයතන අක්ෂරමාලාව

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඒ ඓ ඔ ඕ ඖ (18)

ක ඛ ග ඝ ඞ ඟ, ච ඡ ජ ඣ ඤ ඦ, ට ඨ ඩ ඪ ණ ඬ, ත ථ ද ධ න ඳ, ප ඵ බ භ ම ඹ,

ය ර ල ව, ශ ෂ ස හ ළ ෆ, (අ)ං (අ)ඃ (42)

'ඞ ඦ ඬ ඳ ඹ' යන සඤ්ඤක, ඉංග්‍රීසියෙන් ණයට ගත් වචන සඳහා 'ෆ' අක්ෂරය යෙදීම.

උදා: ෆැන්ටා, ෆිල්ටර්, ෆෑන්, ටොෆි

6. **සමකාලීන සිංහල අක්ෂරමාලාව** (ජේ. බී. දිසානායකයන් හඳුන්වා දුන් හෝඩිය)

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ එ ඒ ඓ ඔ ඕ ඖ ඇ ඈ (18)

ක ඛ ග ඝ ඞ ඟ, ච ඡ ජ ඣ ඤ ඥ, ට ඨ ඩ ඪ ණ ඬ, ත ථ ද ධ න ඳ, ප ඵ බ භ ම ඹ, ය ර ල ව, ශ ෂ ස හ ළ ෆ, (අ)ං (අ)ඃ (42)

- **සමකාලීන සිංහල අක්ෂරමාලාවේ විශේෂතා**

සංවෘත 'ඇ', 'ඈ' එකතු වීම

උදා: ago (ඇගෝ), earth (ඈර්ත්), ඇපාර්ට්මන්ට්, ඈර්නස්ට්, කැනෙක්ෂන්, ජෑර්මිට්

සිංහලයේ අභාවිත 'ඏ, ඐ' හා කලාතුරෙකින් යෙදෙන 'ඦ' ඉවත් කිරීම, බහුල ව භාවිත 'ඥ' ඇතුළත් කිරීම.

7. **ජාත්‍යන්තර සිංහල අක්ෂරමාලාව** (The Unicode Standard Version 3.0 ග්‍රන්ථය 426 පිටුව.)

ජාතික අධ්‍යාපන ආයතන අක්ෂරමාලාව හා බොහෝ දුරට සමාන වන අතර 'ඥ' එකතු වී ඇත.

- **ජාත්‍යන්තර සිංහල අක්ෂරමාලාවේ විශේෂතා**

**පිලි සමරූපීකරණය**

- පාපිල්ල භාවිතයේ සමරූපතාව

සියලු ව්‍යඤ්ජන සමඟ 'ු' වර්ණය සමරූපතාවෙන් යෙදේ. උදා: කුඹුරු කුඹුරු

| | සාම්ප්‍රදායික ක්‍රමය | ජාත්‍යන්තර හෝඩි ක්‍රමය |
|---|---|---|
| ු ූ | සුර, සූර | සුර, සූර |
| ු ූ | කුර, කූර | කුර, කූර |
| ෘ ෲ | රුහුණ, රූණ | රුහුණ රූණ |

- හල් කිරීමේ සමරූපතාව

| සාම්ප්‍රදායික ක්‍රමය | ජාත්‍යන්තර හෝඩි ක්‍රමය |
|---|---|
| ම් ච් ට් | ම් ච් ට් |
| ත් ක් ර් ජ් ඡ් | ත් ක් ර් ජ් ඡ් |

- ඇලපිල්ල භාවිතයේ සමරූපතාව

| සාම්ප්‍රදායික ක්‍රමය | ජාත්‍යන්තර හෝඩි ක්‍රමය |
|---|---|
| ද/දා ඳ/ඳා ඥ/ඥා ඤ/ඤා | දා ඳා ඥා ඤා |

- සංයුක්තාක්ෂර (බැඳි අකුරු) භාවිත නොකිරීම

| | සාම්ප්‍රදායික ක්‍රමය | ජාත්‍යන්තර හෝඩි ක්‍රමය |
|---|---|---|
| රේඵය | ධර්ම, කර්ම | ධර්ම, කර්ම |
| රකාරාංශය | ක්‍රමය, වක්‍ර | ක්රමය, වක්ර |
| යංශය | පද්‍ය, තථ්‍ය, කාව්‍ය | පද්ය, තථ්ය, කාව්ය |

- අකාරාදිකරණයේ වෙනස්වීම්

(අ)ං (අ)ඃ අක්ෂර හෝඩියේ ආරම්භයේ ම දක්වා ඇත.

'ඦ, ඥ' යන අක්ෂර ද්වයය ම යොදා ඇති බැවින් අකාරාදිකරණයේ වෙනස් කම් සිදු විය යුතු ය.

- වාක්‍යාවසාන කිරීමට යෙදෙන 'කුණ්ඩලිය' නම් විශේෂ සංකේතයක් ද මේ හෝඩියෙහි යොදා ඇත.

**අක්ෂර වර්ගීකරණය**

- **ස්වර (පණකුරු / ප්‍රාණාක්ෂර)** "පණකුරු පසෙක් එ ද ලුහුගුරු බෙයින් දස වේ." (සිදත් සඟරාව)

"පහසුයෙන් කියැවියැ හැක්කේ, එ සේ නො කියැවියැ හැකි තැන් කියැවීම පහසු කරන්නේ, ස්වර නමි." (ව්‍යාකරණ විවරණය - කුමාරතුංගඃ 5 පි.)

- **හ්‍රස්ව (ලඝු /ලුහු)** "නො ඇදැ කියවනු ලබනුයේ හ්‍රස්ව යි." (ව්‍යා. වි. 12 පි.) 'අ ඇ ඉ උ ඍ ඏ එ ඔ' (8)
- **දීර්ඝ (ගුරු/දිගු)** "ඇදැ කියවනු ලබනුයේ දීර්ඝ යි." (ව්‍යා. වි. 12පි.) 'ආ ඈ ඊ ඌ ඎ ඐ ඒ ඓ ඕ ඖ' (10)

ආ ඈ ආදි දීර්ඝ ස්වර වඩා දීර්ඝ ව ශබ්ද කරන විට 'ප්ලුත' නම් වේ. (ආමන්ත්‍රණයේ දී, ගී කීමේ දී, හා හැඬීමේ දී යෙදේ.)

- **සන්ධ්‍යක්ෂර (මිශ්‍ර ස්වර**
  අ + ඉ = එ, අ + උ = ඔ,  අ + (අ + ඉ) > අ + එ = ඓ,  අ + (අ + උ) > අ + ඔ = ඖ
- **නම්‍ය-අනම්‍ය ස්වර**
  නම්‍ය - අ - අහයි  උ - උකුරයි  ඔ - ඔතයි
  අනම්‍ය - ඇ - ඇහෙයි  ඉ - ඉතිරෙයි  එ - එතෙයි

බමුණු > බැමිණි, කුකුළු > කිකිළි, සොර > සෙර

- **ගතකුරු (ගාත්‍රාක්ෂර / ව්‍යඤ්ජන / හල්අකුරු)**

"ස්වරයේ ශබ්දය වෙනස් නො කොටැ ඒ ස්වරය හා එක් වියැ හැක්කේ ව්‍යඤ්ජන යි." (ව්‍යා. වි. 6 පි.)

- **ඝෝෂාක්ෂර** - "උගුරෙහි නිනාදය ඇති වන සේ කැරෙන ශබ්දය ඝෝෂ යි." (ව්‍යා. වි. 17 පි.)

'අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඒ ඓ ඔ ඕ ඖ

(අ)ං (අ)ඃ ග ඝ ඞ ඟ ජ ඣ ඤ ඥ ඦ ඩ ඪ ණ ඬ ද ධ න ඳ බ භ ම ඹ ය ර ල ව හ ළ'

- **අඝෝෂාක්ෂර** - "උගුරෙහි නිනාදය ඇති නොවන් සේ කැරෙන ශබ්දය අඝෝෂ යි." (ව්‍යා. වි. 16 පි.)

  'ක ඛ ච ඡ ට ඨ ත ථ ප ඵ ශ ෂ ස ෆ'

- **අල්පප්‍රාණ** "සාමාන්‍ය ස්වාසයෙන් කැරෙන ශබ්දය අල්පප්‍රාණ යි." (ව්‍යා. වි. 18 පි.)

සියලු ස්වර අල්පප්‍රාණ යි.

'(අ)ං (අ)ඃ ක ග ඞ ඟ ච ජ ඤ ඥ ඦ ට ඩ ණ ඬ ත ද න ඳ ප බ ම ඹ ය ර ල ව ශ ෂ ස හ ළ ෆ'

- **මහාප්‍රාණ** "මහා ස්වාසයෙන් කැරෙන ශබ්දය මහාප්‍රාණ යි." (ව්‍යා. වි. 18 පි.)

  'ඛ ඝ ඡ ඣ ඨ ඪ ථ ධ ඵ භ'

- **වර්ගාක්ෂර**

ක ඛ ග ඝ ඞ (ක වර්ගය) ච ඡ ජ ඣ ඤ (ච වර්ගය) ට ඨ ඩ ඪ ණ (ට වර්ගය)

ත ථ ද ධ න (ත වර්ගය) ප ඵ බ භ ම (ප වර්ගය)

'ඟ ඦ ඬ ඳ ඹ' මේ අක්ෂර ද පිළිවෙළින් ඒ ඒ වර්ගවලට අයත් සේ සැලකේ.

වර්ගාක්ෂර නොවන සියලු අකුරු අවර්ගාක්ෂර ය.

- **නාසික්‍යාක්ෂර** - 'ඞ ඤ ණ න ම, (අ)ං, ඥ' යන අක්ෂර ද නාසික්‍ය සේ සැලකේ.
- **අන්තඃස්ථාක්ෂර**

ය ර ල ව - "ස්වර ස්වභාව යැ ව්‍යඤ්ජන ස්වභාව යැ යන ස්වභාව දෙක මැ ඇති හෙයින් ඉ, උ, ඍ, ඏ (ය් ව් ර් ල්) යන සතර ද්විස්වභාව ශබ්ද යි." (ව්‍යා. වි. 8 පි.) (ඉ > ය්, උ > ව්, ඍ > ර්, ඏ > ල්)

වර්ගාක්ෂර හා ඌෂ්මාක්ෂර අතර පිහිටි හෙයින් ද ස්වර හා ව්‍යඤ්ජන යන අක්ෂර දෙවර්ගය අතර තත්ත්වයක් නිරූපණය කරන බැවින් ද මේවා 'අන්තඃස්ථාක්ෂර' නම් වේ.

- **ඌෂ්මාක්ෂර** - ශ ෂ ස හ ෆ (අඃ යන්න ද ඌෂ්මාක්ෂරයක් සේ සැලකේ.)
- **සඤ්ඤකාක්ෂර (අර්ධානුනාසිකාක්ෂර)** - 'ඟ ඦ ඬ ඳ ඹ'
- **අනුස්වාරය (බින්දුව/නිග්ගහීතය)** - (අ)ං - ස්වරයකට අනුව පවතින බැවින් මෙනමි.
- **විසර්ගය (විසර්ජනීය/ද්විබින්දු)**

(අ)ඃ - "මුඛ ශ්වාසය බලාත්කාරයෙන් විසර්ජනය (නික්මැවීම) කරන හෙයිනි." (ව්‍යා. වි. 16 පි.)

- **අක්ෂර උත්පත්ති ස්ථාන**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කණ්ඨජ | අ | ආ | ඇ | ඈ | අං | අඃ | ක | ඛ | ග | ඝ | ඞ | ඟ | හ |
| තාලුජ | ඉ | ඊ | ච | ඡ | ජ | ඣ | ඤ | ඦ | ඥ | ය | ශ | | |
| මූර්ධජ | ඍ | ඎ | ට | ඨ | ඩ | ඪ | ණ | ඬ | ර | ෂ | ළ | | |
| දන්තජ | ඏ | ඐ | ත | ථ | ද | ධ | න | ඳ | ල | ස | | | |
| ඕෂ්ඨජ | උ | ඌ | ප | ඵ | බ | භ | ම | ඹ | | | | | |
| කණ්ඨ තාලුජ | එ | ඒ | ඓ | | | | | | | | | | |
| කණ්ඨ ඕෂ්ඨජ | ඔ | ඕ | ඖ | | | | | | | | | | |
| දන්ත ඕෂ්ඨජ | ව | ෆ | | | | | | | | | | | |

## සන්ධි

"පෙර'පර වණන් ගළපනු සඳ නම්. සඳෙව්, මොහොර ඈ හී."

පූර්ව-අපර වර්ණයන් ගැළපීම සන්ධි නම් වේ. සඳෙව් (සඳ+එව්) මොහොර (මහ+උර) යනාදි ආකාර ඇත්තේ ය.

"පෙර'පර වණන් තිසි - විදිනි ගළපනු සඳ නම්

වණලොප් අදෙස් ඈ එහි - ලැකියනුසරින් දන්නේ." (සිදත් සඟරාව)

පූර්ව-අපර වර්ණයන් තිසි ආකාරයෙන් ගැළපීම සන්ධි නම් වේ. එම සන්ධි සිදු කිරීමේ දී වර්ණ ලොප් වීම, ආදේශ වීම ආදිය ලක්ෂ්‍යානුසාරයෙන් (කාව්‍ය හා ලෝක ව්‍යවහාර උදාහරණ ආශ්‍රයයෙන්) දැන ගත යුතු ය.

"එක් තැන් වූ ශබ්ද අතර ඉඩ නැති වන පරිදි සංවිධානය කිරීම සන්ධි නම්." (කුමා. - ව්‍යා. වි. 31 පි.)

"උච්චාරණ සුඛය පිණිස වන්නා වූ වර්ණයන්ගේ උපශ්ලේෂය තෙම සන්ධි නම්." (ඩබ්. එෆ්. ගුණවර්ධන - සිද්ධාන්ත පරීක්ෂණය)

1. මිශ්‍රණය (ස්වරාදේශ සන්ධි) 2. ආගමය (ආගම සන්ධි) 3. ආයමනය

4. ආරෝහණය (ස්වර සන්ධි) 5. සංක්ෂේපණය 6. සංහරණය

7. ලෝපය (පූර්ව-පර ලෝප සන්ධි) 8. සමීකරණය (පූර්ව-පර රූප සන්ධි) 9. වර්ධනය (ගාත්‍රාක්ෂර ලෝප සන්ධි)

10. ආදේශය (ගාත්‍රාදේශ සන්ධි) 11. අභ්‍යසනය (ද්විත්ව රූප සන්ධි) 12. ක්ෂයණය

**1. ස්වර සන්ධිය (සර සඳ) (ආරෝහණ සන්ධි - කුමාරතුංග)**

සන්ධි වන පද දෙකෙන් මුල් පදයේ අග ව්‍යඤ්ජනය, අග පදයේ මුල් ස්වරය හා ගැළපීම '**ස්වර සන්ධි**' නම්.

"පසැස් ඈ සරලොප් නැත ද සර ගතට පැමිණ වූ බැවින් සර සඳ නම්." (සිදත් සඟරාව)

පසැස් ආදිය ස්වර ලෝපයක් නැත ද, ස්වරය ගාත්‍රයට පැමිණ වූ බැවින් '**ස්වර සන්ධි**' නම් වේ.

"ස්වර ශබ්දයක් ව්‍යඤ්ජන ශබ්දයකට ආරූඪ කිරීමෙන් දෙක එකක් කිරීම ආරෝහණ නම්." (කුමාරතුංග)

මුල් + අසුන උපන් + උපන් නෙත් + අගින් එදින් + එදා ලක් + ඉසුරු

**2. පූර්වස්වර ලෝප සන්ධිය (පෙරසර ලොප් සඳ, 'ලෝපය' - කුමාරතුංග)**

සන්ධි වන පද දෙකෙන් මුල් පදයේ අග ස්වරය (පූර්වස්වරය) ලොප් කොට ඉතිරි ව්‍යඤ්ජනයට, පර පදයේ මුල් ස්වරය (පරස්වරය) පැමිණවීමෙන් ගළපනු ලබන සන්ධිය '**පූර්වස්වර ලෝප සන්ධි**' නම්.

"විදුරවියේ, දිගා, දිනිසුරු, කනීල්, බමරුදුළ, නොමරුල්, සඳෙව්, යළේහි, පහරොත, හඬෝනා ඈ

පෙර සර ලොපා පර සර ගතට පැමිණ වූ බැවින් පෙර සර ලොප් සඳ නම්." (සිදත් සඟරාව)

විදුරු + අවියේ ආදි පදවල පූර්වස්වරය ලොප් කොට පරස්වරය ගාත්‍රාක්ෂරයට පැමිණ වූ බැවින් '**පූර්වස්වර ලෝප සන්ධිය**' නම් වේ. ( කනීල් - රන් ඕංචිල්ලාව, නොමරුල් - වැලි නැති උල්පත).

වෙද + ඇඟිල්ල වපර + ඇසින් රිය + ඇදුරු සිය + ඇසින් කඳුළු + ඇලි

**3. පරස්වර ලෝප සන්ධිය (පරසර ලොප් සඳ, 'ලෝපය' - කුමාරතුංග)**

සන්ධි වන පද දෙකෙන් පරපදයේ මුල් ස්වරය (පරස්වරය) ලොප් කොට මුල් පදය සමඟ ගළපනු ලබන සන්ධිය '**පරස්වර ලෝප සන්ධි**' නම්. උදා:-පිය + උතුමා උමා + අඟන මුදලි + ඉඳු පිළි + උතුරු

"උණලේසුම්, සුස්මෙන්, තියුණු, වැටුසිපත ඈ පරසර ලොප් සඳ නම්." (සි. ස.) (උණලේසුම් - උල්පතෙහි උණුසුම, වැටුසිපත හෙළන ලද/ලෙළදෙන අසිපත)

"ඇති ශබ්දයක් නැති කිරීම ලෝප නම්. ස්වර ලෝප යැ ව්‍යඤ්ජන ලෝප යැ යි ලෝපය ද්විවිධ යි." (කුමා.)

**ස්වර ලෝපය:-**

**ආදි ලෝප** - අබරණ > බරණ අසිපත > සිපත

**අන්ත ලෝප** - ගබ > ගබ් වැඹ > වැම්

**මධ්‍ය ලෝප** - පිනුම > පින්ම (පිම්ම) සැතැපුම > සැතැප්ම

**පූර්වස්වර ලෝප** - දන + ඇති = දනැති **පරස්වර ලෝප** - බුදු + අකුරු = බුදුකුරු

**ව්‍යඤ්ජන ලෝපයඃ**- පුවරු > පෝරු, හිය > ඊය, පොහොය > පෝය

**4. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය (ගතකුරු ලොප් සඳ)**

කුමාරතුංග 'වර්ධනය' යනුවෙන් හඳුන්වන ශබ්ද සංවිධාන ක්‍රමය මෙයට බොහෝ දුරට සමාන ය. (අනුනාසිකත්වය සම්පූර්ණ නාසික්‍යයක් බවට පැමිණැවීම '**වර්ධන**' නම්.)

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග ඇති ස්වරය ගාත්‍රාක්ෂරය සමඟ ලෝපයට පමුණුවා ඉතිරි අර්ධ ව්‍යඤ්ජනය සම්පූර්ණ කර පරපදය සමඟ ගළපන සන්ධිය '**ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය**' නම්.

"ගංරන්, වංමුතු, මුංබියලි, නෙළුම්මල්, අම්මල් ඈ. ගබන් ලොපා මත් වැඩූ බැවින් ගතකුරු ලොප් සඳ නම්." (සිදත් සඟරාව)

ගංරන්, වංමුතු, මුංබියලි, නෙළුම්මල්, අම්මල්, ආදිය 'ග, බ' ලොප් කොට මාත්‍රා වර්ධනය කළ හෙයින් '**ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය**' නම් වේ. (වංමුතු - කලාඳුරු)

ගඟ + රන් මිහිඳු + තලය අඹ + මල් අඟ + කටුස්සා ගඟ + දැළ දඹු + කඩ

5. ස්වරාදේශ සන්ධිය (සරදෙස් සඳ, 'මිශ්‍රණය' - කුමාරතුංග)

සන්ධි වන පද දෙකෙන් මුල්පදයේ අග ස්වරය හා අගපදයේ මුල් ස්වරය යන දෙක වෙනුවට වෙනත් ස්වරයක් ආදේශ වීම '**ස්වරාදේශ සන්ධි**' නම්.

"මෙහෙසුරු, මොහොර, ලඹෝරා ඈ **අ**, **ඉ**, **උ**න් ලොපා **එ**, **ඔ**, **ඕ** අදෙස් කළ බැවින් සරදෙස් සඳ නම්." මෙහෙසුරු ආදියෙහි **අ**, **ඉ**, **උ** යන ස්වර ලොප් කොට **එ**, **ඔ**, **ඕ** ආදේශ කළ බැවින් '**ස්වරාදේශ සන්ධි**' නම් වේ.

"**මිශ්‍රණය නම් ස්වර ශබ්ද දෙකක් මිශ්‍ර කොටැ අන්‍ය ශබ්දයක් ඇති කිරීම යි.**" (කුමාරතුංග)

| | | |
|---|---|---|
| **අ + ඉ = එ** | **අ + උ = ඔ** | **අ + උ = ඕ** |
| මහ + ඉසුරු | මහ + උර | ලඹ + උදරා |
| මහෙසුරු | මහොර | ලඹෝදරා |
| මෙහෙසුරු | මොහොර | ලඹෝරා |

- සිංහලයේ එ/ඒ + අ/ඇ = ඈ බවට පත් වේ.

දෙ + අත දෙ + අවුරුදු දෙ + ඇඟිලි දෙ + අත් දෙ + අගසව් මේ + අත ඒ + අත

- සංස්කෘතයේ එන ගුණ සන්ධිය ද ස්වරාදේශ සන්ධියක් සේ සැලකිය හැකි ය.

**අ/ආ + ඉ/ඊ = ඒ** - සුර + ඉන්ද්‍ර මහා + ඉන්ද්‍ර ධන + ඊශ්වර ලංකා + ඊශ්වර

**අ/ආ + උ/ඌ = ඕ** - චූල + උදර මහා + උත්සව

**6. ගාත්‍රාදේශ සන්ධිය (ගතදෙස් සඳ - 'ආදේශය' කුමාරතුංග)**

සන්ධි වන පද දෙකෙන් අග පදයේ මුල ඇති හෝ මුලපදයේ අග ඇති ගාත්‍රාක්ෂරය වෙනුවට වෙනත් ගාත්‍රාක්ෂරයක් ආදේශ කිරීම, මුලපදයේ අග ඇති ස්වරය ලොප් කළ ගාත්‍රාක්ෂරය වෙනුවට වෙනත් ගාත්‍රාක්ෂරයක් ආදේශ කිරීම '**ගාත්‍රාදේශ සන්ධි**' නම්. උදා: පිරි+කම්, බිලි+කම්, සුණු+කම්, පස්+සිල්

"අත්වරු, සිත්වරු, මහණුවම්, දඬුවම්, ගිනියම් ඈ පරකකරනට වයත් හා කප්පිල්, කැසුප්පොතු, ලප්නාරඟ, හෙප්තොට, සුත්බත්, බුත්සරණ ඈ බදන් සර ලොපා පතත් හා අදෙස් කළ බැවින් ගතදෙස් සඳ නම්." (සි.ස.) (කප්පිල් - මයුරයා/සඳැස්පිල්, ලප්නාරඟ - ගසක නමක්)

අත්+කරු, සිත්+කරු, මහණු+කම්, දඬු+කම්, ගිනි+කම්, ආදියෙහි පර වූ '**ක**' යනුවල '**ව**, **ය**' යන අකුරු හා කබ+පිල් කැසුබු+පොතු, ලබු+නාරඟ, හෙබ+තොට, සුදු+බත්, බුදු+සරණ ආදියෙහි '**බ**, **ද**' යන අක්ෂර හා ස්වර ලොප් කොට '**ප**, **ත**' යන අක්ෂර ආදේශ කළ බැවින් '**ගාත්‍රාදේශ සන්ධි**' නමි.

"එක් ශබ්දයකට අන්‍ය ශබ්දයක් මාරු කිරීම ආදේශ නමි." (කුමාරතුංග)

**ස්වරාදේශ:-** අඹුරු = අඹර තඹුරු = තඹර

**ව්‍යඤ්ජනාදේශ:-**

සිති + කම් = සිතියම් සාල් = සාල් පස් + සිල් = පන්සිල්

දඬු + කම් = දඬුවම් බෙදුම = බෙද්ම > බෙත්ම පස් + දහස් = පන්දහස්

සාවා = හාවා රදගම = රද්ගම > රත්ගම කන් + මුල = කම්මුල

**7. පූර්ව රූප සන්ධිය (පෙරරූ සඳ, 'සමීකරණය' - කුමාරතුංග)**

සන්ධි වන පද දෙකෙන්, මුල් පදයේ අග ව්‍යඤ්ජනයේ ස්වරූපය, පරපදයේ මුල් ව්‍යඤ්ජනයට සමාන කිරීමෙන් ගළපන සන්ධිය '**පූර්වරූප සන්ධිය**' නම් වේ.

"අත්තම්, වත්තම්, ගෙත්තම්, පන්නම්, විස්සම් ඈ පර කකරනට පෙරරූ ලද්දෙන් පෙරරූ සඳ නම්." (සි.ස.). අත්+කම්, වත්+කම්, ගෙත්+කම්, පන්+කම්, විස්+කම් ආදියේ පර වූ කකාරයන්ට පූර්වරූපය ලද හෙයින් '**පූර්වරූප සන්ධිය**' නම්.

**8. පරරූප සන්ධිය (පර රූ සඳ - 'සමීකරණය' - කුමාරතුංග - සිදතේ මෙය නැත.)**

සන්ධි වන පද දෙකෙන්, මුල් පදයේ අග ඇති ගාත්‍රාක්ෂරයට, අග පදයේ මුල් ගාත්‍රාක්ෂරයේ ස්වරූපය ගැන්වීමෙන් ගළපන සන්ධිය '**පරරූප සන්ධිය**' නම් වේ.

හක් + බෙල්ලා අත් + සන ලිප් + ගල වක් + පිහිය අත් + ලස්

"ශබ්දයක්, ළඟ සිටි අන්‍ය ශබ්දයක් හා සම බවට පැමිණුවීම සමීකරණ නමි." (කුමාරතුංග)

**ස්වර සමීකරණය:-** පිරි + සුදු = පිරිසිදු කොළොඹ = කොළඹ මහෙසුරු = මෙහෙසුරු

**ව්‍යඤ්ජන සමීකරණය:-** වත් + කම් = වත්තම් සත් + හස් = සත්තස් හිප් + කඩුව = හික්කඩුව

පතුල > පත් + ල > පල්ල අතුල > අත් + ල > අල්ල

**8. ද්විත්ව රූප සන්ධිය (දෙරූ සඳ, 'අභ්‍යාසනය' - කුමාරතුංග)**

සන්ධි වන පද දෙකෙන්, මුල්පදයේ අග ඇති ස්වරය ලොප් කොට, ඉතිරි ගාත්‍රාක්ෂරය හෝ ස්වර රහිත ගාත්‍රාක්ෂරය හෝ ද්විත්ව කිරීමෙන් ගළපන සන්ධිය '**ද්විත්ව රූප සන්ධිය**' නම් වේ.

"වැල්ලවුරු, හෙළිල්ලඹු, තඹපල්ලෙන්, කුල්ලෙව් ඈ පෙරසර ලොපා ගතට දෙරූ දුනවූ බැවින් දෙරූ සඳ නම්" (සි. ස.)

වැලි+අවුරු, හෙළිලි+අඹු, තඹපලු+එන්, කුලු+එව් යනාදියෙහි පූර්වස්වරය ලොප් කොට, ගාත්‍රාක්ෂරයට ද්විත්ව රූපය කිරීමෙන් ගළපන සන්ධිය '**ද්විත්ව රූප සන්ධිය**' නම් වේ.

වැදි + එක් කොලු + ආ බලු + ආ

**පූර්ව ව්‍යඤ්ජන ද්විත්වය** **පර ව්‍යඤ්ජන ද්විත්වය**

පොල් + අත්ත වල් + අම්බලම නුවණ + කාර උරුම + කාර

"එක් ව්‍යඤ්ජන ශබ්දයක් දෙකක් බවට පැමිණැවීම අභ්‍යසන නමි." (කුමාරතුංග)

කෙකි + අ = කෙක්ක රතු + ආ = රත්තා කුරුලු + ඕ = කුරුල්ලෝ

**9. ආගම සන්ධිය (අගම් සඳ, 'ආගමය' - කුමාරතුංග)**

සන්ධි වන පද දෙක අතරට ස්වරයක් හෝ ගාත්‍රාක්ෂරයක් පැමිණවීමෙන් ගළපනු ලබන සන්ධිය '**ආගම සන්ධිය**' නමි.

"වණක්හු නිසා ඔහු නො ලොපා වනුයේ අගම් නම්." (සිදත් සඟරාව)

වර්ණයක් ඇසුරු කොට, ලෝප ආදි කිසිවක් නැති ව සිදු වනුයේ ආගමය නම් වේ.

- "මිත්‍රවදාගමඃ" ආගමය මිත්‍රයකු වැනි ය. (සාරස්වතය)

"පිරියත්, මියුගුණු, සිපියෙව්, දුවඟ, රුවාරු, තුනුවඟ, පුනරුත්, නිරොද ඈ පෙරසර නො ලොපා, **යවරන්** අගම් කෙළෙන් අගම් සඳ නම්." (සිදත් සඟරාව)

පිරි+අත්, මී+අඟුණු, සිපි+එව්, දු+අඟ, රූ+අරු, තුනු+අඟ, පුන+උත්, නි+ඔද ආදියෙහි පූර්වස්වරය ලොප් නො කොට, **ය**, **ව**, **ර** යන අක්ෂර ආගම කළ හෙයින් '**ආගම සන්ධිය**' නම් වේ.

දෙ + ආකාර වි + අවුල් නො + එන දෙ + උර කටු + අල නි + අතුරු සිවු + අඟ

- "නැති ශබ්දයක් පැමිණීම ආගම නම් වේ." (කුමාරතුංග)

**ස්වරාගමඃ**- දූන් + දු = දූනුදු, තුන් + රුවන් = තුනුරුවන්

**ව්‍යඤ්ජනාගමයඃ**- පඹ + ආ = පඹයා සිවුපා + ආ = සිවුපාවා සු + අසු - සුවසු > සුවාසූ

- "ස්වරය දීර්ඝ කිරීම ආයමන නම් වේ." (කුමාරතුංග)

කල් + අතුර = කලාතුර නව + අනු = නවානු අට + අනු = අටානු

නො + එන > නෙ + එන = නේන නො + ඉල්ලූ = නි + ඉල්ලූ = නීල්ලූ

- "එක්තැන් වූ ශබ්ද ත්‍රයයක් එක් ශබ්දයක් බවට පැමිණැවීම සංක්ෂේපණය නමි."

ගුණය = ගුණේ - ගුණ් + අ + ය් + අ > ගුණ් + ඒ > ගුණේ, බලය = බලේ

- "දීර්ඝ ස්වරය හ්‍රස්ව කිරීම සංහරණ නමි."

  දවහල් = දවාල් = දවල් ගියහොත් = ගියෝත් = ගියොත්

- "අනුනාසිකත්වය සම්පූර්ණ නාසික්‍යයක් බවට පැමිණැවීම වර්ධන නමි."

  මඟ > මං දඹු + කඩ > දම්කඩ > දංකඩ බිඳුවා > බින්දවා > බින්දා

- "සම්පූර්ණ නාසික්‍යයක් ක්ෂීණ කොටැ අනුනාසිකභාවයට බැස්වීම ක්ෂයණ නමි."

  තමුරු - තඹුරු    බමර - බඹර

**මිශ්‍ර සිංහල සන්ධි**

**1. සවර්ණ ස්වර දීර්ඝ සන්ධිය (සමාන ස්වර දීර්ඝය)**

1. අ + අ = ආ - පරම + අර්ථ = පරමාර්ථ    2. ඉ + ඉ = ඊ - මුනි + ඉන්ද්‍ර = මුනීන්ද්‍ර

ආ + ආ = ආ - විද්‍යා + ආලය = විද්‍යාලය    ඊ + ඊ = ඊ - මහී + ඊශ්වර = මහීශ්වර

අ + ආ = ආ - දේව + ආලය = දේවාලය    ඉ + ඊ = ඊ - මුනි + ඊශ්වර = මුනීශ්වර

ආ + අ = ආ - යථා + අර්ථ = යථාර්ථ    ඊ + ඉ = ඊ - මහී + ඉන්ද්‍ර = මහීන්ද්‍ර

3. උ + උ = ඌ - ගුරු + උපදේශ = ගුරූපදේශ    4. ඍ + ඍ = ඎ - පිතෘ + ඍණ = පිතෲණ

ඌ + ඌ = ඌ - භ්‍රූ + ඌර්මී = භ්‍රූර්මී (බැම නමැති තරංගය)

උ + ඌ = ඌ - චාරු + ඌරු = චාරූරු (මනහර කලවා)

ඌ + උ = ඌ - භ්‍රූ + උත්ක්ෂේප = භ්‍රූත්ක්ෂේප (බැම නැගීම)

**2. ගුණ සන්ධිය** ('අ' වර්ණයට අන්තඃස්ථ ස්වරයක් පර කල්හි ඒ දෙක එක් ව ගුණ ස්වරයක් වේ.)

අ/ආ + ඉ/ඊ = ඒ - සුර + ඉන්ද්‍ර = සුරේන්ද්‍ර,    මහා + ඉන්ද්‍ර = මහේන්ද්‍ර

ධන + ඊශ්වර = ධනේශ්වර,    ලංකා + ඊශ්වර = ලංකේශ්වර

අ/ආ + උ/ඌ = ඕ - චූල + උදර = චූලෝදර,    වෘත්ත + ඌරු = වෘත්තෝරු

මහා + උත්සව = මහෝත්සව,    රම්භා + ඌරු = රම්භෝරු

අ/ආ + ඍ = අර් - දේව + ඍෂි = දේවර්ෂි,    මහා + ඍෂි = මහර්ෂි

**3. වෘද්ධි සන්ධිය** ('අ' වර්ණයට සන්ධි ස්වරයක් පර කල්හි වෘද්ධි සන්ධිය වේ.)

අ/ආ + ඒ = ඓ - චිත්ත + ඒකාග්‍රතා = චිත්තෛකාග්‍රතා,    ප්‍රභා + ඒක = ප්‍රභෛක

අ/ආ + ඓ = ඓ - දිව්‍ය + ඓශ්වර්ය = දිව්‍යෛශ්වර්ය,    උමා + ඓශ්වර්ය = උමෛශ්වර්ය

අ/ආ + ඕ = ඖ - දන්ත + ඕෂ්ඨජ = දන්තෞෂ්ඨජ,    මහා + ඕඝ = මහෞඝ

අ/ආ + ඖ = ඖ - දිව්‍ය + ඖෂධ = දිව්‍යෞෂධ,    මහා + ඖෂධ = මහෞෂධ

**4. අර්ධ ස්වර සන්ධිය**

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග '**ඉ/ඊ**' හෝ '**උ/ඌ**' සමඟ පසු පදයේ මුල විෂම ස්වරයක් යෙදුණු විට පිළිවෙළින් '**ය්**' හා '**ව්**' ආදේශ වේ.

අති + අවශ්‍ය > අත් + ඉ + අවශ්‍ය > අත් + ය් + අවශ්‍ය > අත්‍යවශ්‍ය

ජාති + ආලය = ජාත්‍යාලය, ප්‍රති + උපකාර = ප්‍රත්‍යුපකාර, පරි + ඒෂණ = පර්යේෂණ

අනු + අර්ථ = අන්වර්ථ, අනු + ඒෂණ = අන්වේෂණ, ගුරු + අක්ෂර = ගුර්වක්ෂර, බහු + අර්ථ = බහ්වර්ථ

5. ව්‍යඤ්ජන සන්ධි

**ඝෝෂීකරණය:** අඝෝෂයකින් පර ව ඝෝෂයක් යෙදුණු විට එම අඝෝෂය සවර්ණ ඝෝෂය බවට පත් වේ. උදා: දික් + විජය = දිග්විජය, පෘථක් + ජන = පෘථග්ජන, ෂට් + අභිඥා = ෂඩභිඥා, තත් + ආශ්‍රිත = තදාශ්‍රිත

**තාලුජීකරණය:** 'ත්' යන්නෙන් පර ව තාලුජ ව්‍යඤ්ජනයක් යෙදුණු විට 'ත්' > 'ච්' වේ. පර ව 'ශ්' ඇත්නම් 'ඡ්' බවට පත් වේ. සත් + චරිත = සච්චරිත, ශරත් + චන්ද්‍ර = ශරච්චන්ද්‍ර, තත් + ශිෂ්‍ය = තච්ඡිෂ්‍ය

- 'ත්' යන්නෙන් පර ව 'ල්' යෙදුණු කල්හි 'ත්' 'ල්' බවට පත් වේ.

විද්‍යුත් + ලතා = විද්‍යුල්ලතා, විද්‍යුත් + ලේඛා = විද්‍යුල්ලේඛා

**නාසික්‍යකරණය:** අඝෝෂ ව්‍යඤ්ජනයකින් පසු නාසික්‍ය ශබ්දයක් යෙදුණු විට එම අඝෝෂය ඝෝෂ බවට පත්වී, පසු ව එම වර්ගයේ නාසික්‍යය බවට ද හැරේ. උදා: ජගත් + නාථ > ජගද් + නාථ = ජගන්නාථ, ජගත් + මාතා > ජගද් + මාතා = ජගන්මාතා, ෂට් + මුඛ > ෂඩ් + මුඛ = ෂණ්මුඛ

**ද්විත්වීකරණය:** ස්වරයකින් පර වූ 'ඡ්' යන්න ද්විත්ව වේ. මෙහි දී ප්‍රථමයෙන් යෙදෙනුයේ අල්පප්‍රාණ අක්ෂරය යි.

ශ්වේත + ඡත්‍ර = ශ්වේතච්ඡත්‍ර, ධවල + ඡත්‍ර = ධවලච්ඡත්‍ර, ස්ව + ඡන්ද = ස්වච්ඡන්ද, පරි + ඡේද = පරිච්ඡේද

6. විසර්ග සන්ධි:

1. 'අ' කාරයෙන් පසු විසර්ගය යෙදී, පසු පදයෙහි මුලට ඝෝෂයක් යෙදුණු කල්හි, 'අ' සහ විසර්ගය 'ඕ' බවට පත් වේ. උදා: යශඃ + රාව = යශෝරාව, පයඃ + ධර = පයෝධර, වයඃ + වෘද්ධ = වයෝවෘද්ධ, මනඃ + මය = මනෝමය, තපඃ + වන = තපෝවන

2. විසර්ගයෙන් පසු ව ඌෂ්මයක් (ශ්, ෂ්, ස්) වූ විට, විසර්ගය වෛකල්පික වශයෙන් පරපදයේ ඇති ඌෂ්මයේ ස්වරූපය ගනී. උදා: දුඃ + සාධ්‍ය = දුස්සාධ්‍ය, දුඃ + ශීල = දුශ්ශීල

3. විසර්ගයට පෙර 'අ/ආ' හැර අන්‍ය ස්වරයක් යෙදී, පර ශබ්දය ඝෝෂයක් වූයේ නම් විසර්ගයට 'ර්' ආදේශ වේ. උදා: නිඃ + ජන = නිර්ජන, නිඃ + නාමික = නිර්ණාමික, දුඃ + ජන = දුර්ජන, දුඃ + බල = දුර්බල

4. පූර්ව පදාන්ත විසර්ගය 'ර්' බවට පත්වී පරපදය සමඟ එක් වේ.

පුනඃ + ආගමන > පුනර් + ආගමන = පුනරාගමන, පුනඃ + උත්පත්ති > පුනර් + උත්පත්ති = පුනරුත්පත්ති, පුනඃ + උත්ථාපන > පුනර් + උත්ථාපන = පුනරුත්ථාපන, පුනඃ +භව = පුනර්භව

## උක්තාඛ්‍යාත පද සම්බන්ධය

**1. ඒකවචන උක්තයක් සමඟ ඒකවචන ආඛ්‍යාත පදයක් යෙදේ.**

1. මම යමි / යන්නෙමි / ගියෙමි.
2. ඔහු යයි / යන්නේ ය / ගියේ ය.
3. නුඹ/තෝ යහි / යන්නෙහි / ගියෙහි.
4. ගැහැනිය යයි / යන්නී ය / ගියා ය.
5. ගස වැටෙයි / වැටෙන්නේ ය / වැටුණේ ය.
6. තරුව බබළයි / බබළන්නේ ය / බැබළුණේ ය.

**විකල්පය:-** ස්ත්‍රී ලිංග උක්තයක් සමඟ යෙදෙන අතීත, අනාගත ඒකවචන ආඛ්‍යාත පද ලිංග භජනය කරයි.

1. අම්මා දර කැඩුවා ය / කඩන්නී ය.
2. එළදෙන දිය බිව්වා ය / බොන්නී ය.

**විකල්පය:-** උක්තය ස්ත්‍රී ලිංග ඒකවචන වුවත් අතීත ආඛ්‍යාතය බහුවචනයෙන් තැබීම සම්භාව්‍ය සිංහල රීතිය යි.

1. "බැමිණි අඟනක් වූය පියකරු" (කා. ශේ.)
2. "මායා තුසී පුරයෙහි වුසූ"

3. "මද්‍රී දේවී දරු දෙදෙනා නො දක හැඬූ" (වෙස්සන්තර ජා.) 3. "විහාරමහාදේවී පුත් රුවනක් වැදූ"

5. "බැමිණි ලිය සසොබා - එපුත් රුවනග වැදූ මහබා" (කා. ශේ.)

**2.** බහුවචන උක්තයක් සමඟ බහුවචන ආඛ්‍යාත පදයක් යෙදේ.

1. අපි යමු / යන්නෙමු / ගියෙමු.          3. නුඹලා/ තොපි යහු / යන්නෙහු / ගියෙහු.

2. ඔවුහු යති/ යන්නෝ ය / ගියෝ ය.   4. ගැහුණු යති / යන්නෝ ය / ගියෝ ය.

**විකල්පයෘ-** අප්‍රාණවාචී බහුවචන උක්තයක් සමඟ වුව ද යෙදෙනුයේ ඒකවචන ආඛ්‍යාත පදයකි.

1. ගස් වැටෙයි.          2. ගංගා ගලා බසියි.          3. තාරකා බබළයි.          4. මල් පිපෙයි.

5. "විය තැන තැන පියුම් පොකුණු" (බුදුගුණ අලංකාරය)

**විකල්පයෘ-** අප්‍රාණවාචී උක්තයක '**ඕ, හු**' යන ගෞරවාර්ථ ප්‍රත්‍යයයන් යෙදූ විට එහි ආඛ්‍යාතය බහුවචනයෙන් තැබේ.

1. "දන්තයෝ විෂම වෙති" (ධර්ම ප්‍රදීපිකාව)          2. "දිව බෙරහු ගුගුළහ" (අමාවතුර)

3. "පස් පියුම්හු සුපුෂ්පිත වූහු" (ධර්ම ප්‍රදීපිකාව)          4. තාරකාවෝ බබලති / තාරකා බබළයි.

5. ගංගාවෝ ගලා බසිති /ගංගා ගලා බසියි.          6. පියුම්හු පිපෙති / පියුම් පිපෙයි.

7. රීතිහු වෙනස් වෙති / රීති වෙනස් වෙයි.

**3.** දෙනා, දෙන, දෙනෙක්, කැන්, සෙන්, සෙනඟ, රැළ, රැස, රැන, සමූහය, රංචුව, මුළ, පෙළ, ගණ, කැල, පිරිස ආදි සමූහවාචී පද උක්ත වන විට ආඛ්‍යාතය බහුවචනයෙන් තැබේ.

1. මිනිස්සු තුන් දෙනා සභාවට පිවිසෙති.          2. තුන් දෙනෙක් පැන දිවූහ.

2. ඇත් රැළ වනය දෙවනත් කරති.          3. ගොවියෝ රැසක් කුඹුරු කොටති.

5. මිනිස්සු සමූහයක් මහපාරේ දුවති.          6. ගිරා රැන ඉගිලෙති.

7. හරක් රංචුව කුඹුරට වදිති.          8. සිසු පෙළ විභාගය ලියති.

9. දරු කැල සෙල්ලම් කරති.          10. සිසු පිරිස වන්දනාවේ යති.

11. "නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ" (ගුත්.)          12. "නුවටෝය මූ හැමදෙන" (බු. අ.)

13. "මෙතෙක් දෙන මල් පහන් පුදති" (පූජාවලිය)          14. "මින් රළ වුත් ගංවෙරළට රැස්වූ" (ගුත්.)

15. "මහත් ගජසෙන් සිටිති තැන තැන" (බු. අ.)          16. "කෙසේ පවසති රුසිරු කිවි කැල"(කා. ශේ.)

17. "එ සඟ ගණ මේ ලෙසින් පැවසූ" (ගුත්.)          18. "තමන් මනදොළ පුරති බිඟු රළ" (ගුත්.)

19. "සෙනඟ එ පමණ වෙතී යොදුනෙන" (සඳ කිඳුරු දා)

20. "දන කැන් දනිති තොරතුරු ඇසුමෙන් තෙපල" (පරෙවි සං.)

**විකල්පයෘ-** රැස, සමූහය, පෙළ වැනි පද අප්‍රාණවාචී නාම පද සමඟ යෙදෙන විට ආඛ්‍යාතය ඒකවචන වේ.

1. තරු රැස/පෙළ/සමූහය බබළයි.          2. "සැදෑ වලා පෙළ පෙනිණි ගුවනා" (කා. ශේ.)

3. "මතකල් කමලුපුල් වන මිණි ගණ පෙනිණි" (ගුත්.)

**4.** ඇතැමෙක්, ඇතැම්මු, සමහරෙක්, සමහරු, කවුරු, අයෙක්, කිසිවෙක්, කෙනෙක් යන පද උක්ත වන විට ආඛ්‍යාතය බහුවචනයෙන් තැබේ.

1. ඇතැමෙක්/ඇතැම්මු/ඇතැම්හු දෙවියන් පුදති.
2. සමහරෙක්/සමහරු බුදුන් පුදති.
3. මෙහි සුල මුල කවුරු දනිති ද?/දනිත් ද?
4. කිසිවෙක්/කෙනෙක් ගී ගයති.
5. "සමහරු අත්වැල් බැඳ බුදුන් සිසාරා දිවෙති" (පූජා.)
6. "කවුරු කියවා නිමවා ගනිත් ද?" (බුත්.)
7. "සියක් අය කෙරෙති වැඳ පුද පැදකුණුය" (හංස සං.)
8. "නටත් අයෙක් සුරා මතින්" (ගුත්.)
9. "කෙනෙක් වැනසෙති හැනී හුල්වල" (කා. ශේ.)

**විකල්පය**:- කිසිවෙක්, කෙනෙක්, අයෙක් පැහැදිලිව ම ඒකවචනාර්ථය දෙන විට ආඛ්‍යාතය ඒකවචනයෙන් තැබේ.

1. කාමරයෙහි කිසිවෙක් නො සිටියි. 2. එක් කෙනෙක් ආපසු යයි. 3. එක් අයෙක් පැන දුවයි.

4. තවත් කෙනෙක් ඔහුට එකතු විය. 5. පියදාස නමැති අයෙක් අත් අඩංගුවට ගන්නා ලදි.

**5.** යමෙක්, කවරෙක් උක්ත වන විට ආඛ්‍යාතය ඒකවචන වෙයි. (සමහර විටෙක බහුවචනයෙන් ද තැබේ.)

1. යමෙක් පොත් කියවයි ද ඔහු උගතෙක් වෙයි. 2. කවරෙක් මේ බස අදහයි ද?

3. කවරෙක් එතැනට යයි ද?

4. "උන් එදා දුන් රඟ දුටොත් තව සුර සැපත් කවරෙක් පතා" (ගුත්.)

5. "නතනා විනා කෙ වණා සොබන එ උයනා" (කුස ජා. කා.)

**6.** 'ද, ත්, හා, සහ' යන සමුච්චයාර්ථ නිපාත පද යෙදෙන විට එහි ආඛ්‍යාත පදය එක ම පුරුෂයේ නම් එවිට එහි බහුවචනයෙන් ද එසේ නොවන විට පුරුෂ තුනෙහි බලවත්කමේ අනුපිළිවෙළ අනුව බහුවචනයෙන් ද තැබේ.

- **පුරුෂ තුනෙහි ප්‍රබලත්වය** 1. උත්තම පුරුෂ 2. මධ්‍යම පුරුෂ 3. ප්‍රථම පුරුෂ

1. ගුරුවරයා ද ළමයා ද පාසලට යති.
2. ඔහු ද මම ද ගමට යමු.
3. ඔහු ද මම ද නුඹ ද ගමට යමු.
4. නුඹ ද මිනිසා ද ගමට යහු.
5. නුඹ ද අපි ද ගමට යමු.
6. තොපි ද අපි ද මිනිස්සු ද ගමට යමු.

**විකල්පය**:- ප්‍රධාන උක්තය හැඳින්වෙන පද කිහිපයක් 'ද' නිපාතයෙන් එක් වුව හොත් ප්‍රධාන උක්තයට අනුව ආඛ්‍යාතය තැබේ.

1. වෙද මහතා ධනවතෙක් ද බලවතෙක් ද වේ.
2. උගත්තු ධනවත්තු ද බලවත්තු ද නො වෙති.

**විකල්පය**:-අප්‍රාණවාචී හා සප්‍රාණවාචී පද දෙකක් සමුච්චයාර්ථ නිපාතයෙන් එක්වූ විට එහි ආඛ්‍යාතය බහුවචනයෙන් තැබේ.

1. ගොනා ද රිය ද ගමට යති.
2. ගිරවා ද කූඩුව ද වළට පෙරළෙති.

7. අසම්භාව්‍ය ක්‍රියාවට පූර්වයෙන් ඇති නාම පද අනුක්තයෙන් තැබේ.

- **කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියාව**

"කියත උන් මෙතෙපල - ආයෙය ඇදුරු ගුත්තිල" (ගුත්.)

"වරල් විදහා මසුන් ඉපිලේත" (බු. අ.)

1. කුකුළන් හඬලද්දී මම එළියට බැස්සෙමි. 2. මා ගී ගයද්දී ඇ අසා සිටියා ය.

3. නිළියක නටද්දී පිරිස හූ කීහ. 4. අප නාද්දි අම්මා පැමිණියා ය.

- **අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාව**

1. මිනිසුන් දිව්ව හොත් අපි ද දුවමු. 2. මා ගියොත් බිරිඳ දුක් වන්නී ය.

3. ගංගාවන් වියළී ගිය හොත් කුඹුරු පාළු වනු නිසැක ය.

4. ත්‍රස්තවාදීන් පහර දුන හොත් සටන් විරාමය කැඩෙනු ඇත.

8. සංශයාර්ථය හෝ වාර්තාර්ථය හඟවන අන්තර් වාක්‍යවල දී අනුක්ත පද සමඟ ප්‍රථම පුරුෂ බහුවචන ආඛ්‍යාතය යෙදේ.

"ඇදුර තුටු නො වෙතියි - නො සිත'ප සිප් නො දනිතියි

උනිමු වෙණ සදතියි - නො දත්තෙමු ගායනා කරතියි" (ගුත්.)

1. සොරුන් බැංකු බිඳති'යි අපි දනිමු. 2. මා පැන දුවති'යි ඔහු කීවේ ය.

3. අප ශිල්ප නොදනිති'යි ඔවුහු සිතූහ. 4. තා එහි ගියහ'යි මම නො සිතමි.

5. ගංගාවන් සොබාදහම අලංකාර කරති'යි කවියෝ කියති.

4. මරාගෙන මැරෙන්නන් බෝම්බ පුපුරුවති'යි මිනිස්සු රුස්වීමට නො ගියහ.

10. පූර්ව ක්‍රියා හෝ භාව ක්‍රියා පද සමඟ යෙදෙන '**ඇත, නැත, තිබේ**' යන පද අනුක්තය හා සම්බන්ධ වේ.

1. දෙවියන් දෙවොලට පැමිණ නැත. 2. ශිෂ්‍යාවක ගීයක් ගයනු ඇත. 3. ඔවුන් වැඩ කර නැත.

4. අප වරප්‍රසාද ලබා නැත. 5. ගංගාවන් වියලී ගොස් තිබේ. 6. මා පොත කියවා ඇත.

**විකල්පයː-** '**ඇත, නැත**' යන පද වාක්‍යයක ආඛ්‍යාතය වෙනුවට යෙදෙන විට උක්ත කර්තෘ භාවිත වේ.

1. අප රටෙහි ආදර්ශවත් නායකයෝ ඇත/නැත. 2. මූලාසනයෙහි කිසිවෙක් නැත.

3. "අංගුලිමාල නම් සොරෙක් ඇත" (බුත්)

11. අන්තර් වාක්‍යවල යෙදෙන '**යනවා, බලනවා, ආවා, බැලුවා**' වැනි කෘදන්ත සමඟ අනුක්තය යෙදේ.

1. ඔවුන් ගමට යනවා මම දුටුවෙමි. 2. මා ගීයක් ගයනවා ඔබ අසා තිබේ ද?

3. දුරියක අඬනවා ඔහු අසා සිටියේ ය. 4. තා රා බොනවා මම බලා සිටියෙමි.

12. 'ඇයි, කෙසේ ද, කවරදා ද, කවදා ද, මොනවා ද' වැනි ප්‍රශ්න වාචී යෙදුම් සමඟ අනුක්තය යෙදේ.

1. භික්ෂූන් බණ කියන්නේ ඇයි? 2. මිනිසුන් බියර් බීම නවත්වන්නේ කවදා ද?

3. ඔවුන් දන් කරන්නේ මොනවා ද? 4. මා එතනට ආ යුත්තේ කවරදා ද?

13. '**යුතු, මැනවි, යෙහෙකි**' පද සමඟ අනුක්තය යෙදිය යුතු ය.

1. ඔවුන් සත්‍ය ගරුක විය යුතු ය. 2. ගැහැනු දරුවන් ලැජ්ජා බය ඇතිව හැදිය වැඩිය යුතු ය.

3. මා රටට අවංක වීම යෙහෙකි. 4. බල්ලන් මෙහි මූත්‍ර කිරීම මැනවි.

5. පයින් යන්නන් දකුණු පසින් යා යුතු ය.

6. දේශපාලකයන් දිනපතා රූපවාහිනියේ පෙනී සිටීම නො මැනවි.

**විකල්පය**:- යුතු යන්නෙන් තැනෙන '**යුත්තේ, යුත්තෝ, යුත්තාහ**' වැනි පද සමඟ උක්ත පද යෙදිය යුතු ය.

1. මිනිස්සු සත්‍යගරුක විය යුත්තෝ ය/යුත්තා හ.

2. කාන්තාවෝ රාත්‍රියෙහි තනි මඟ නොයා යුත්තෝ ය.

14. ප්‍රාර්ථනාර්ථ '**වා**' නිපාතය සහිත වාක්‍යවල උක්ත රූප හා ඊට අනුරූප ආඛ්‍යාත පද යෙදේ.

1. සියලු සත්වයෝ නිදුක් වෙත්වා! 2. මම නිදුක් වෙම්වා! 3. හොරු වැනසෙත්වා!

4. සියලු ඥාතිමිත්‍රාදීහු මේ නිවේදනය පිළිගනිත්වා! 5. මුනිවරයෙක් ලොව පහළ වේවා!

15. 'වැනි, සඳහා, උදෙසා, මෙන්, කරා, සේ' ආදී නිපාත සමඟ අනුක්තය යෙදේ.

"පෙර සුරඟනන් වැනි - අඟනෝ සොඳුරු රැසිරෙති
මස් ලේ නැති බැවිනි - උදක් ගෙයිගෙයි යකින්නන් වැනි" (බු. අ.)

1. මෙය කාන්තාවන් සඳහා/උදෙසා වෙන් කරන ලද වැසිකිළියකි/මැදිරියකි.

2. සොරුන් මෙන් සේ ගමන් නො යන්න. 3. මා කරා පැමිණි අයට සංග්‍රහ කරන්න.

16. එක ම තැනැත්තකු ගැන කීමේ දී '**වූ, වන**' කෘදන්ත පදවලට මුලින් ඇති නාම පදය අනුක්ත වන අතර පසු ව ඇති නාම පද උක්ත වේ.

1. ප්‍රකට විචාරකයකු වූ මාර්ටින් වික්‍රමසිංහ දක්ෂ ලේඛකයෙක් ද විය.

2. අග්‍රගණ්‍ය ගායකයකු වන අමරදේව ප්‍රමුඛ පෙළේ වාදකයෙක් ද වෙයි.

3. දක්ෂ නිළියක වූ රුක්මණීදේවි නම රැන්දූ ගායිකාවක් ද වූවා ය.

17. '**හා, සහ**' යන නිපාත '**සමඟ**' යන අර්ථයේ යෙදෙන විට ඊට පූර්වයෙන් ඇති නාම පදය අනුක්තයෙන් යෙදේ.

1. ගොවියෝ අලින් හා ගැටුම් ඇති කර ගනිති.

2. ගායකයෙක් ගායිකාවක සහ වේදිකාවට පැමිණියේ ය.

3. ගායිකාවක් ගායකයකු සහ වේදිකාවට පැමිණියා ය.

4. "සුරන් සහ සහසැස් නොකර සිටියේ අහස් කුස් හිස්" (ගුත්.)

5. "කෙලෙසුන් සහ දිගැටි - මඟුල් කඩුවෙන් කපා කෙස් වැටී" (බු. අ.)

18. සැකයක් පළ කරන 'වි' නිපාතය සමඟ අනුක්තය යෙදේ.

1. මා තරඟයෙන් දිනාවි. 2. අප රටින් නෙරපාවි.

3. නායකයන් නිසි මඟ දක්වාවි. 4. දෙවියන් අපගේ මුහුණ බලාවි.

19. '**හෝ** ' නිපාතය යෙදෙන විට අවසාන ක්‍රියාවට ආසන්න ම උක්තයට අනුව ආඛ්‍යාතය යෙදේ.

1. ඔහු හෝ මම හෝ ගමට යමි. 2. මල්ලී හෝ නුඹ හෝ නගරයට යහි.

3. විදුහල්පතිතුමා හෝ නියෝජ්‍ය විදුහල්පතිනිය හෝ උත්සවයට සහභාගී වන්නී ය.

4. අක්කලා හෝ අයියලා හෝ මල්ලී හෝ ගමට යන්නේ ය.

( අවසාන නාමය සමඟ '**හෝ**' නිපාතය නොයෙදීමේ රටාවක් දැනට ප්‍රචලිත ව පවතී)

20. සාමානාර්ථ (අනන්‍යාර්ථ) ඇති '**හෙවත්** ' යන්න එක ම පුද්ගලයකු ගැන කීමේ දී යෙදේ.

1. මේ විදුහලේ විදුහල්පති හෙවත් පියදාස මහතා රැස්වීමට එන්නේ ය.

2. ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපතිනිය හෙවත් චන්ද්‍රිකා කුමාරතුංග විදේශ ගත වූවා ය.

3. කොග්ගල මහා ප්‍රාඥයා හෙවත් මාර්ටින් වික්‍රමසිංහ ගම්පෙරළිය ලිව්වේ ය.

21. විකල්පාර්ථවත් '**නොහොත්** ' යන්න එක් අයකුට වැඩි පිරිසක් ගැන කීමට යෙදෙන අතර ආඛ්‍යාතය ආසන්න උක්තයට අනු ව යෙදේ.

1. අගමැති නොහොත් ජනාධිපතිනිය සාකච්ඡාවට පැමිණියා ය.

2. ගුරුවරිය නොහොත් ගුරුවරයා පන්තියට පැමිණියේ ය.

3. අමිතා නොහොත් ප්‍රමිතා, දමිත සමඟ නිතර ගමන් ගියා ය.

22. 1. '**ව**' ධාතුවෙන් සැදුණු ආඛ්‍යාත කර්මයක් නොගන්නා බැවින් එවැනි වාක්‍ය සම්පූර්ණ ඒවා නො වේ. අර්ථය සම්පූර්ණ කිරීමට ආඛ්‍යාතය පූර්ණයක් යෙදිය යුතු ය. එවිට උක්තයත් ආඛ්‍යාත පූර්ණයත් සමාන ලිංග, සමාන වචන, සමාන විභක්ති ගනියි.

1. බොහෝ සිංහලයෝ බෞද්ධයෝ වෙති. 2. බොහෝ දමිළයෝ හින්දූහු වෙති. 3. ඈ නිළියක් වූවා ය.

4. අපි හොර නායකයෝ වෙමු. 4. නුඹලා උගත්තු වෙහු. 6. තෝ සොරෙක් වෙහි.

02. මේ වාක්‍යවල ආඛ්‍යාතය වෙනුවට '**ය, යි**' නිපාත බොහෝ විට යෙදේ.

1. බොහෝ සිංහලයෝ බෞද්ධයෝ ය. 2. ඈ නිළියක් ය. 3. බොහෝ දමිළයෝ හින්දූහු ය.

4. මම ගුරුවරයෙක් ය. 5. තෝ සොරෙක් ය. 6. වවන්නෝ දිනන්නෝ ය.

03. මෙවන් වාක්‍යවල '**ල, ලු**' යන නිපාත යෙදීමෙන් ශ්‍රැතිසූචනාර්ථයක් ඇති වෙයි.

1. බොහෝ සිංහලයෝ බෞද්ධයෝ ලු. 2. බොහෝ කොටි ත්‍රස්තවාදීහු දමිළයෝ ලු?

3. අපි සොරු ලු. 4. ඈ නිළියක් ලු. 5. නුඹ ගායකයෙක් ලු. 6. ජපන්නු හපන්නු ලු.

04. '**ද**' නිපාතය යෙදීමෙන් මේ වාක්‍ය ප්‍රශ්න බවට හැරේ.

1. බොහෝ සිංහලයෝ බෞද්ධයෝ ද? 2. බොහෝ කොටි ත්‍රස්තවාදීහු දමිළයෝ ද?

3. ඔවුහු දේශපාලකයෝ ද?    4. ඈ ගායිකාවක් ද?    5. මම ගොනෙක් ද?

05. අතැම් විට ආඛ්‍යාත පූර්ණයට නාම ධාතුක ක්‍රියාවක් යෙදේ.

1. මම ගුරුවරයෙක්මි. 2. අපි පොහොසත්මු. 3. ඔහු හිඟන්නෙකි.

4. ඈ හිඟන්නියකි. 5. තෝ සොරෙහි ද නො සොරෙහි ද? 6. තෙපි කිනම්හු ද?

23. ගෞරවාර්ථ ප්‍රත්‍යයයන් භාවිතයෙන් හැඟවෙන පුද්ගලයා එක්කෙනකු වුවත් බහු අර්ථයක් ප්‍රකාශ කෙරේ.

01. මෙසේ යොදනු ලබන ප්‍රත්‍යයන් වනුයේ '**ඕ, හු, ආණ, අණු, අණි, අණ්ඩි**' ආදිය යි.

1. මහසත්හු අබිදම් දෙසූහ. 2. බුදුහු දෙව්රමට වැඩියහ. 3. වළගම්බාවෝ යුද්ධ කළහ.

3. රජ්ජුරුවෝ සේනා සංවිධානය කරති. 4 හාමුදුරුවෝ අවමඟුල් පෙරහැරේ වඩිති.

5. පියාණෝ පුතුන්ට අවවාද දෙති. 6. පුතණුවෝ / මුත්තණුවෝ / මයිලණුවෝ / ගමෙහි විසූහ.

7. මෑණියෝ / දියණියෝ / නැගණියෝ / නැන්දණියෝ /නෑනණ්ඩියෝ දරුවන් නළවති.

මේ උක්ත පදයන්ගේ අනුක්තය සකස් වනුයේ රජ්ජුරුවන් / වළගම්බාවන් / හාමුදුරුවන් / පියාණන් / පණ්ඩිතයන් / පුතණුවන් / මෑණියන් / දියණියන් / නැගණියන් ආදි වශයෙනි.

02. '**වහන්සේ** ' යන පදය ද ගෞරවාර්ථ බහු අර්ථයක් ගනී. එහි ක්‍රියාව සැකසීමේ දී සේක යන්න මෙන් ම සාමාන්‍ය බහු වචන ආඛ්‍යාතය ද යෙදෙන අතර නාම පදය අනුක්ත ස්වරූපයක් ගනී.

1. මාහිමිපාණන් වහන්සේ දම් දෙසූ සේක. 2. බුදුරජාණන් වහන්සේ දනට වැඩි සේක.

3. මෑණියන් / පියාණන් වහන්සේ දරුවන්ට ඔවා දෙන සේක / දෙති.

4. බිසවුන් වහන්සේ / රජ්ජුරුවන් වහන්සේ මෙසේ අණ කළ සේක / කළහ.

03. ගෞරවාර්ථය සඳහා '**දෑ, පා**' යන පද ද සිංහලයේ යෙදේ.

1. බිරින්දෑ / මෑණියන්දෑ දරුවන් නාවන දෑ ය / නාවති.

2. සමණුන්දෑ දහම් දෙසන දෑ ය. 3. රජ පා එනුවර ආරක්‍ෂා කරති.